**ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

---------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් සහ භාණ්ඩාගාරය වෙත කළ ප්‍රේෂණ පිළිවෙලින් රු.48,291,000 ක් සහ රු.870,915 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි පිළිවෙලින් රු.48,039,988 ක් සහ රු.619,903 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා 2023.12.31 දිනට වූ CIGAS වැඩසටහන මඟින් ලබා ගත් ශේෂ පිරික්සුම උපයෝගී කර ගෙන ඇති බව හා ඒ අනුව ශේෂ පිරික්සුමේ අග්‍රිම ගිණුමට අදාල 7002 හි හර හා බැර ශේෂ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කළ බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුදල් මඟින් අග්‍රිම පියවීම රු.870,915 ක් වුවද අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ-3) රු.915 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වියදම් මගින් අග්‍රිම පියවීම රු.870,000කින් වැඩි වී තිබුණි. | 2023 ජූනි මස පියවන ලද අග්‍රිම ශේෂය මගහැරී ඇති බවත් මෙවැනි අතපසුවීම් ඉදිරියේ දී වළක්වා ගැනීමට සටහන් කර ගන්නා බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 5/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 3.4 වගන්තිය ප්‍රකාරව සෑම වැය විෂයයක් වෙනුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනසට හේතු ඒසීඒ- 2(II) ආකෘතියෙහි දැක්විය යුතු වුවද, මූලධන | අතපසුවීමකින් මෙය ACA 2 (ii) ආකෘතියෙහි ඇතුළත් වී නොමැති බව. | මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය. |

වත්කම් අත්පත් කර ගැනීම යටතේ මෘදුකාංග සංවර්ධනය සඳහා රු.10,000,000 ක අයවැය ප්‍රතිපාදනය වැය නොවීම සම්බන්ධ හේතු දක්වා නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළඳ ලකුණු, පේටන්ට් හා කාර්මික සැලසුම් දත්ත ඩිජිටල්කරණය කිරීමේ කටයුතු සඳහා 2023 ක්‍රියාකාරී සැලැස්මෙහි රු.මිලියන 10.9 ක් වෙන්කර තිබුණද ලෝක බුද්ධිමය දේපළ කාර්යාලය සමඟ සමගාමීව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බැවින් එම ආයතනය විසින් ව්‍යාපෘතිය ආරම්භ කරන තුරු සමාලෝචිත වර්ෂයේදී එහි වියදම් සිදු නොවූ අතර මූලික කටයුතු කිහිපයක් පමණක් සිදු කර තිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාලව ලිපිගොනු පරිලෝකනය සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම ආරම්භ කරනු ලැබුවේ 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දීය. ලෝක බුද්ධිමය දේපළ කාර්යාලය විසින් ව්‍යාපෘතිය ආරම්භ කරන තුරු බුද්ධිමය දේපළ අරමුදලින් වියදම් කිරීමට ඇස්තමේන්තු මුදල් භාවිතා කිරීමට නොහැකි වූ බව. | සැලසුම් කළ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් (ICTA) සර්වර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2016 දෙසැම්බර් 30 දින අවබෝධතා ගිවිසුමකට එළඹ, එදිනම රු.මිලියන 32.5 ක් ගෙවීම් කර තිබුණි. එහෙත් එම ගිවිසුම සේවා දායක විසින් කඩකිරීම නිසා ගෙවන ලද මුදල ආපසු ගෙවීම කඩිනම් කරන මෙන් අදාළ රේඛීය අමාත්‍යාංශය සහ තාක්ෂණ අමාත්‍යාංශය මඟින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත 2024 පෙබරවාරි 16 දින ඉල්ලීම් කර තිබුණද වාර්තාවේ දින වනවිටත් මුදල් ලැබී නොතිබුණි. එම නිසා 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සර්වර් පහසුකම් සම්පාදනය කිරීම ඇතුළත් කර ඇතත් එය ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි. | 2024.02.16 දිනැතිව අධ්‍යක්ෂ ජනරාල් විසින් හා 2024.04.19 දිනැතිව රේඛිය අමාත්‍යාංශයේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපි යොමු කර ඇතත් ඒ සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බව. | මුදල් අය කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කටයුතු සඳහා වසර 4 ක කාලයක සිට ස්ථිර විගණකවරයෙක් පත් කර නොතිබුණි. | පුරප්පාඩුව සඳහා නිලධාරියකු අනුයුක්ත කරන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් සිදු කර ඇති බව. | විගණන පනතේ 40 වගන්තියට අනුකූල විය යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2015 වර්ෂයේදී අනුමත වූ දින සිට පුරප්පාඩු වී පවතින අතර, 2015 හා 2016 වර්ෂවලදී අනුමත කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ක් අනුමත කළ දින සිටම පුරප්පාඩු ව පැවතුණි. | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ නොමැති බැවින් බඳවා ගැනීම සිදුකර නොමැති බව. එමෙන්ම සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුරේ වැඩබැලීම සඳහා 2023-06-15 දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු අනුයුක්ත කළද එම නිලධාරියා සඳහා කාර්යාලයේ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බැවින් වැඩ බැලීමේ තනතුරින් ඉවත් වූ බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අනුමත පේටන්ට් නිලධාරී තනතුරු 10 දෙපාර්තමේන්තුගත තනතුරු වූ නමුත් ඒ සඳහා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. එම නිලධාරීන්ට බුද්ධිමය දේපළ විෂය සම්බන්ධව දේශීය හා විදේශීය පුහුණු අවස්ථා 3 ක සිට 26 ක් දක්වා අතර ප්‍රමාණයකට සහභාගී වී තිබුණ ද, මෙම නිලධාරීන්ට වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ස්ථාන මාරුවීම් | තනතුරු 10 ම පුරප්පාඩුව බැවින් මෙම තනතුරුවලට අදාළ රාජකාරි, විද්‍යා උපාධිධාරී සංවර්ධන නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි. එම නිලධාරීන්ට බුද්ධිමය දේපළ විෂය සම්බන්ධව දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබාදිය යුතුව ඇතත් ඔවුන් ඒකාබද්ධ සේවයේ නිලධාරීන් බැවින් වාර්ෂික ස්ථාන | ආයතනයේ කාර්යසාධනය රැකෙන ලෙස පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සිදුවන බැවින් පේටන්ට් ක්ෂේත්‍රයට අදාළව ලබාගත් පුහුණුව පේටන්ට් අංශයේ ඉදිරි කාර්යසාධනයට යොදාගත නොහැකිවීමෙන් එහි කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | මාරු නියෝග වලට යටත් වන බව. | |
| (ඇ) | වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම, අලුත් කිරීම, වෙනස් කිරීම, පැවරීම සහ අවසර ගිවිසුම් ඇතුලු කටයුතු පැවරී තිබූ බුද්ධිමය දේපළ නිළධාරී තනතුරු 13 න් තනතුරු 08 ක් විගණන දිනය වන විට පුරප්පාඩු වී තිබූ අතර නිලධාරී පුරප්පාඩුව වෙළඳ ලකුණ අංශයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකි බැව් නිරීක්ෂණය විය. | මෙම පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇති බැවින් විභාගය පැවැත්වීමට අදාළ ගැසට් නිවේදනයේ කෙටුම්පත සකස් කර අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත යොමුකළ බව. | -එම- |